***ISBN 978-955-4563-72-8***

# වර්තමාන සමාජය තුල ළමා සුරක්ෂිත භාවය අහිමි වීම සඳහා බලපාන සමාජ සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**ටී. ජී. ඩී. උදයකාන්ති**
**සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**

**සංක්ෂේපය**

*සමාජයේ රැකවරණයක් බලාපොරොත්තු වන ළමුන් සමාජය තුළම අපයෝජනයන්ට හා අපචාරයන්ට ගොදුරු වීම සමාජයට දූෂ්කෘත්‍යාත්මක ලෙස බලපාන සංසිද්ධියක් ලෙස සමාජ ගත වී ඇත. ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වීම, ඒ පිළිබඳව නොදැනුවත් බව හා ළමයා ළමයෙකු ලෙස නොසැලකීම මේ සඳහා බලපායි. ළමා අපයෝජනයක් යනු සමාජය විසින් ළමයකු වැරදි ක්‍රියාවලට පොළඹවා ගැනීමයි. අපචාරයක් යනු ළමයා සමාජය තුළ වැරදි ක්‍රියාවලට පෙළඹවීමයි. සාහිත්‍යය විමර්ශනය තුළින් හඳුනාගත් කරුණු අනුව මෙය වර්තමානයේ සමාජ ගත වී වර්ධනය වූ සංසිද්ධියක් ලෙස පිළිගත නොහැකියි. මෙම සාහිත්‍ය විමර්ශනයේ මුඛ්‍ය පරමාර්ථය වර්තමාන සමාජය තුල ළමා සුරක්ෂිත භාවය අහිමි වීම සඳහා බලපාන සමාජසාධකයන් හඳුනාගැනීමයි. ඊට අමතරව ළමා අයිතිවාසිකම්, අපචාර හා අපයෝජනයන් සඳහා ඇති නීති රෙගුලාසි අවබෝධ කර ගැනීම හා එය වැළැක්වීමට ගත යුතු ක්‍රියා මාර්ග හඳුනාගැනීම අනෙකුත් අරමුණු වේ. ඒ අනුව සාහිත්‍යය මූලාශ්‍ර තුළින් ලබාගත් ද්විතික දත්ත හා සමාජ නිරීක්ෂණය තුළින් ලබාගත් තොරතුරු අනුව ළමා අපචාරයන් මෑත කාලීනව සිදුවීම සඳහා මාධ්‍යය භාවිතය, දරිද්‍රතාවය, පශ්චාත් යුධ සමය, දෙමව්පියන් විදෙස් ගතවීම, බාරකරුවන්ගේ නොසැලකිල්ල, පවුලේ ව්‍යුහය හා කාර්ය භාරයන්ගේ වෙනස්වීම, සමාජය තුල අනෝමීයත්වය බිඳ වැටීම, සමාජ ගත නොවූ ලිංගික අධ්‍යාපනය, මානසික ව්‍යාධීන් සහිත රෝගීන් ප්‍රමාණය ඉහළ යාම ළමා අපචාර හා අපයෝජනයන් වර්ධනය වීමට හේතු වී ඇත. ඒ සඳහා අදාළ නීති සම්පාදනය, දරුවන් කෙරෙහි සමාජය තුළ සංවේදී කථිකාවතක් ගොඩනැගීම, මාධ්‍යය මගින් දරුවන්ට ඔබින වැඩසටහන් විකාශනය, ළමා අපයෝජකයන් සඳහා නීති දැඩි කිරීම, අපයෝජනයන් හා අපචාරයන් පිළිබඳ දරුවන් දැනුවත් කරලීම තුළළමා අපචාර හා අපයෝජනයන් සඳහා විවර වී ඇති සමාජ අවකාශය අවම කළ හැකිය.*

*මුඛ්‍ය පද : ළමයා, ළමා අපචාර, ළමා අපයෝජන, ළමා අයිතිවාසිකම්*

## හැඳින්වීම

ළමයින් අපචාරයන්ට ගොදුරු වීම හා ළමා මරණ වාර්තා වීම ඉහළ යාම සමකාලීන සමාජය තුල ප්‍රබල සමාජ ගැටළුවක් බවට පත් වී ඇත. මේ පිළිබඳ කථිකාවත් සමාජය තුල ගොඩනැගී ඇති අතර සමාජ විද්‍යාඥයින්,මනෝ විද්‍යාඥයින්, ගැටුම් විශ්ලේෂකයින් අපරාධ විද්‍යාඥයින් ඇතුළු මේ හා සම්බන්ධ විද්වතුන් ,මත දරන්නන් හා සමස්ත සමාජයම ඍජු හෝ වක්‍රව ඊට හේතු සොයන්නට පෙළඹී ඇත.ළමුන්ගේ ළමා කාලය අහිමි වීම, නිසි සමාජානුයෝජනයක් නොමැති වීම, දෙමාපිය සෙනෙහස හා රැකවරණය දුරස් වීම, පවුල් ව්‍යුහයේ හා කෘත්‍යයන්ගේ වෙනස්වීම, පශ්චාත් යුධ සමය හා අපරාධ මානසිකත්වය, තාක්ෂණය හා මාධ්‍යය අව භාවිතය හා ඒ තුළ වර්ධනය වන අපගාමී මානව චර්යා රටාවන් වැනි සාධකයන් ළමා අපචාරයන් වර්ධනය වීම සඳහා පසුබිම සකස් කරන්නට ඇත.මේ අනුව ළමයා පිළිබඳ සමාජගත ආකල්පයන් හඳුනා ගැනීම හා ළමයා සුරක්ෂිත කරලීමට ඇවැසි පසුබිම සකස් කිරීම මෙහිදී වැදගත් වේ. ළමයා හෙවත් බාල වයස්කරුවන් යනුවෙන් අදහස් කරන්නේ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින්ය. නැතහොත් 18 නොයික්ම වූ පුද්ගලයින්ය. මව්කුස පිළිසිඳගත් දා පටන්ම සෑම දරුවකුම ජීවියෙකු හෙවත් ළමයෙකු ලෙස නීතිය යටතේ ද පිළිගනියි. නෛතිකව ගත් කල කලලයක් ලෙස මව්කුස තුල වැඩෙන මෙලොවට බිහි නොවූ දරුවන්ද ළමයින් ලෙස පිළිගනියි.දරුවා පූර්ව ප්‍රසව අවස්ථාවේදී සිට බිහිවී ළමයෙකු බවට වර්ධනය වීම දක්වාත්, ඉන් ඔබ්බටත් ළමයෙකුගේ වගකීම සමාජයට බාර වී ඇත. මේ අනුව සමාජය බලාපොරොත්තු වන නීරෝගී, බුද්ධිමත් ,මානව හිතවාදී, චින්තනයෙන් පරිපූර්ණ ළමයෙකු සමාජගත කිරීම සමස්ත සමාජයටම පැවරී ඇති වගකීමකි.එහිදී ළමුන් වැඩිහිටියන්ගෙන් ඉවත් කර හඳුනාගෙන ළමයින්ට අයත් භූමිකාව පමණක් ළමයාගෙන් බලාපොරොත්තු විය යුතුය.

''1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනිවා ප්‍රකාශනයෙහි හා 1959 එක්සත් ජාතීන් විසින් සම්මත කර ගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් පරිදි 1989 නොවැම්බර් 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය රැස්ව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය යනුවෙන් ගිවිසුමක් ඇති කර ගන්නා ලදි. එදින එම අවස්ථාවට සහභාගී වූ රටවල් 193 අතුරින් 191 ක්ම එම ගිවිසුමට පක්ෂව ඡන්දය ලබාදීම හේතුවෙන් මෙය සැබැවටම විශ්මිත ප්‍රඥප්තියක් බවට පත්විය. ශ්‍රී ලංකාව මෙම

*ISBN 978-955-4563-72-8*

ගිවිසුමට 1991 දී දිවුරුම් දී ඇතුලත් වී ඇත. මෙම ව්‍යවස්ථාවට වගන්ති 54 ඇතුලත්ය. එහි පළමු වගන්තිය ළමයකු යන්න කවුරුන්ද යනුවෙන් අර්ථ දක්වා ඇත.''(කුරේ, 2006, පි. අ. 13)

ඒ අනුව 1989 දී සම්මත කර ගන්නා ලද එක්සත් ජාතීන්ගේ විශ්ව ළමා ප්‍රඥප්තියට අනුව ළමයා යනු වයස අවුරුදු 18 ට අඩු සියළුම තැනැත්තන් යන්න ලංකාවේ නීතිය අනුව ගලපා ඇත. පුරාණ කාලයේ ළමයා ළමයකු ලෙස සැලකීම බැහැර කළ අතර මධ්‍යතන යුගය තුල ද ඒ තත්ත්වය එතරම් වෙනස් නොවීය. එකල ළමුන්ට ඇඳුම් අන්දවන ලද්දේත් කුඩා වැඩිහිටියන් ලෙසය. ඔවුන් හෙනේත් කුඹුරේත් ගෙදරත් වැඩ කල අතර ළදරු කාලයේ විශේෂ රැකවරණයක් හෝ ආරක්ෂාවත් නොදෙන ලදි.17 සියවසේ ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවන තුරුම ළමයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු නොවීය. ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ සමග ළමයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු වූ අතර 19 වන සියවසේ අග භාගයේ හා 20 වන සියවස මුල් භාගයේ සමාජයේ වෙනස් වන ස්වභාවය ළමයින්ගේ තත්වය වැඩි දියුණු කිරීමට මග පෑදුනි. මිනිස් ශ්‍රමය වෙනුවට යන්ත්‍ර යොදා ගැනීම ඇරඹීම නිසා ශ්‍රමිකයින් ලෙස ළමයින්ගේ අගය අඩු විය. සමාජය තුළ ප්‍රාග්ධන හා ශ්‍රම සංචලනය තුල මධ්‍යම පන්තිය ප්‍රසාරණය වීමත් මධ්‍යම පන්තිය තුල ළමයා නිර්ධන පන්තියේ ළමයෙකුට වඩා සමාජ වරප්‍රසාද ලබා ගැනීමත් නිසා බහුතර මධ්‍යම පන්තියේ දරුවා සමාජය තුල ''ළමයා'' යන සංකල්පයෙන්ම ඉස්මතු විය. එමෙන්ම අධ්‍යාපන සෞඛ්‍ය සුබසාධන කටයුතු සඳහා රජයේ මැදිහත් වීම ඉහළ යාම හේතුවෙන් ළමුන්ට සමාජ වරප්‍රසාද සඳහා අවකාශය විවර විය.මේ අනුව ක්‍රමයෙන් පවුල තුල ළමයාට සුවිශේෂී ස්ථානයක් හිමිවිය. අදවන විට එය තවදුරටත් වර්ධනය වී ළමයින් පිළිබඳ සංවිධාන මෙන්ම ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්ති බිහි වීම දක්වා අවධානය යොමු වී ඇත.

ළමයා යන්න සලකා බැලීමේදී, 1989 නොවැම්බර් 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තියේ 1 වන ව්‍යවස්ථාවට (වගන්තියට) අනුව මෙම ප්‍රඥාප්තියේ කාර්යයන් සඳහා ළමයකු යන්නෙන් එම ළමයාට අදාල නීතිය යටතේ වයස අවුරුදු 18 ට පෙර ඔහු වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18 ට අඩු සෑම මනුෂයකුම අදහස් වේ'' යන්නයි.(කුමාර, 2001, පි. අ. 01)

මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානයේ ළමා අංශය මගින් ප්‍රකාශයට පත් කර ඇති ''ළමා අපයෝජනය සහ නීතිය'' (නීතිය සහ නෛතික ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනයක්)යන කෘතියේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සලකා බැලීමේදී ළමයා යන්න මෙසේ නිර්වචනය කර ඇත.

''අපරාධ නඩුවලදී හැර ළමයකුට (වයස අවුරුදු 18 ට අඩු) විරුද්ධව හෝ ළමයකු විසින් හෝ කෙළින්ම නඩුවක් පැවරිය නොහැකිය. ළමයකු විසින් හෝ ළමයකු වෙනුවෙන් නඩුවක් පැවරීමට ඇති විට නඩුවේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා ළමයා වෙනුවෙන් ළමයාගේ සහායක මිත්‍රයා වශයෙන් පෙනී සිටීම පිණිස ළමයාගේ අයිතිය හා ගැටීමක් නොමැති ළමයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ වෙනත් සුදුසු කෙනෙකු පත් කරන ලෙස අධිකරණයට ඉල්ලීමක් කල යුතුවේ. ළමයා වෙනුවෙන් නඩුව පවරනු ලබන්නෙත් පවත්වාගෙන යනු ලබන්නෙත් එසේ පත්කරනු ලබන සහායක මිත්‍රයා විසිනි. ළමයකුට එරෙහිව නඩුවක් පවරන විට අධිකරණය හමුවේ ළමයාගේ අයිතිවාසිකම් රැකබලා ගැනීම සඳහා ළමයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ වෙනත් සුදුසු පුද්ගලයකු හෝ ළමයාගේ භාරකරුවකු වශයෙන් පත් කරනු ලැබේ. මේවාට අදාල නිශ්චිත විධිවිධාන සිවිල් නඩු විධාන සංග්‍රහයේ ඇත.''(මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය 2000, පි. අ. 53)

පොලිස් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරන ලද ළමා අපයෝජනය පිළිබඳ අත්පොතේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීති අනුව ළමුන්ගේ වයස් මට්ටම් විවිධ ලෙස සඳහන් ව ඇත.

''ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිවල වයස අවුරුදු 3,8,10,12,14,16,18 වශයෙන් ළමුන්ගේ වයස් මට්ටම් විවිධ අයුරින් සඳහන්ව තිබීමයි. ඒනිසා විවිධ ව්‍යවස්ථාපිත නීති අනුව ළමයෙකු යන්නෙන් විවිධ අයුරින් වයස් මට්ටම් දක්වා ඇති අන්දම මෙසේ දැක්විය හැකිය.

- දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් වගන්තිවල අවුරුදු 8,10,12,14 හා 16,18 යන වයස් මට්ටම්වල ළමයින් සම්බන්ධයෙන් කරන අපරාධ පිළිබඳ සඳහන් වේ.

ISBN 978-955-4563-72-8

- ළමයින් හා තරුණයින් පිළිබඳ පනතේ ළමයෙකු යනු වයස අවුරුදු 14 ට අඩු පුද්ගලයෙකු වන අතර ගැටවරයෙකු යනු වයස අවුරුදු 14-15 අතර ළමයෙකු වේ.
- අදාල අඥාපනත යටතේ ගැහැණු ළමයා යන්නෙන් වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකු අදහස් වේ.
- කාන්තාවන්, තරුණයින් සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳව ආඥාපනත යටතේ ළමයෙකු යන්නෙන් වයස අවුරුදු 14 ට අඩු පුද්ගලයෙකු අදහස් වන අතර, තරුණයෝ යන්නෙන් වයස අවුරුදු 14 සම්පුර්ණ වුද වයස අවුරුදු 18 ට අඩු වූද පුද්ගලයින් අදහස් වේ.
- ළමයෙකු යන්නෙන් වයස අවුරුදු 18 ට අඩුසැම මනුෂ්‍යයෙකුම අදහස් වේ.''(අමරසේකර, 2005, පි. අ. 115)

ළමයා යන්න මෙතෙක් සඳහන් අර්ථ දැක්වීම තුළ වයස අවුරුදු 18 අඩු යන්න නිර්වචනය කළ හැකි වුව ද සැබැවින්ම නවජයා සමාජය තුල තනිව වගකීම් දරමින් සමාජගත වීමට අවශ්‍යය පෞරුෂ්‍යය වර්ධනය වන තුරු ඔහු හෝ ඇය ළමයෙකු ලෙස සමාජ විද්‍යාත්මකව හැදින්විය හැකිය.

## ළමා අයිතිවාසිකම්

මිනිසෙකුට තමන්ට හිමි සමාජ තත්ත්වය අනුව භුක්ති විඳීමට ඇති වරප්‍රසාද අයිතිවාසිකම් ලෙස හැඳින්විය හැකිය. ළමාවිය යනු මිනිස් ජීවිතයේ එක් අවධියකි. මෙහිදී වැදගත් වන්නේ ළමා වියට ආවේණික වූ ශාරීරික හා මානසික නොමේරුභාවය නිසා වැඩිහිටියන් විසින් ළමයකුගේ උත්පත්තියට පෙර හා පසුව ළමයාට විශේෂ ආරක්ෂාව හා රැකවරණය සැලසිය යුතුය යන්න පිළිගත් සම්මතයයි. මෙසේ පිළිගැනීම නිසා වැඩිහිටියන් විසින් ළමයාට ඉටුකළ යුතු වු වගකීම් හේතුකොට ගෙන පැන නගින ළමා අයිතිවාසිකම් සමුහයක් වේ.ළමයාගේ ජාතිය ,ආගම, වර්ගය, ආගම ,දේශපාලනය,පුම්තිරිබව යන සාධක කෙසේ වුවද ළමයෙකු ලෙස තමාට හිමි අයිතිවාසිකම් භුක්ති විදීමට සැම ළමයෙකුටම අයිතියක් තිබේ. ලොව පැවති පළමු හා දෙවන යුධ ගැටුම් මෙන්ම පැවති යුද්ධයන් තුලත් වැඩිම ක්‍රීඩාවක් වින්දේ ළමුන්ය. ඔවුන් යුද්ධයකට ඔත්තුකරුවන් හා ළමා සොල්දාදුවන් ලෙස සක්‍රීය සෘජු දායකත්වයක් ලබාදුන් අතර අහිමි වූ ළමා ජීවිත ගණන මෙන්ම ඔවුන්ට අහිමි වු ළමා කාලය හාළමා කාලය අහිමි වූ දරුවකු සමාජගත වීම තුල සමාජයට සිදුවන දෘෂ්කෘත්‍යාත්මක බලපෑම සංඛ්‍යාත්මකව තක්සේරු කළ නොහැකිය.උක්ත තත්ත්වය අනුව එකල යුරෝපීය රටවල් ප්‍රමුඛ ලොව බොහෝ රටවල ළමයින්ගේ සමාජ තත්ත්වය පහළ වැටුනි.

''ලෝක ළමා පරපුර වැඩිහිටි සමාජයේ ග්‍රහණයට නතු වෙමින් අඩු වැටුප් වලට ශ්‍රමය විකුණන අර්ධ ශ්‍රමිකයින් නැත්නම් වහලුන් ලෙසත් ලිංගික කටයුතු සඳහා යොදවා මුදල් රැස්කිරීමටත්, ඔත්තු බැලීම, මත්ද්‍රව්‍ය භාවිතයට හුරු කරවීම, යුධ සේවයට හා වහල් සේවයේ හා වෙන වෙනත් කටයුතු ක්‍රියා නිසා සිදුවන ළමා ප්‍රචණ්ඩත්වයන් , ජීවත් වීමට තරම් නොවූ මුඩුක්කු, පැල්පත් හා අනාථ කඳවුරු නිර්මාණය වීමත් , එහිදී හොඳ සෞඛ්‍ය තත්ත්වයක් හෝ මනා අධ්‍යාපනයක් නොලැබී යාම හේතුවෙන් මන්දපෝෂණය හා දරිද්‍රතාවයේ පතුලටම ගිය පවුල් සංස්ථාවන්ගේ බිඳ වැටීමද හේතු කොට ගෙන සමස්තළමා පරපුරටම අත්වූ ඉරණම ඉතා ඛේදජනක එකක් විය. ඒ නිසාම ඔවුන් මානසික හා සමාජීය වශයෙන් බෙලහීන තත්ත්වයට ඇද වැටිනි.''(කුමාර, 2001, පි.අ. 02)

19 වන සියවසේ ඇති වූ උක්ත තත්ත්වය සලකා බැලීමේදී ළමයින් පිළිබඳව වැඩි අවධානයක් යොමු වූ අතර 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තිය නමින් ප්‍රචලිත විශ්ව ප්‍රකාශනයක් සම්මත කිරීමට පෙර ඒ සඳහා පසුබිම සකස් කළ ප්‍රධාන සාධක කිහිපයක් හඳුනාගත හැකිය. 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම මෙහිදී වැදගත් වේ. එය මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලෝක ජනමතයක් ඇති කිරීමටත් ඒ තුලින් සාමය සඳහා අවශ්‍යය පරිසරය සකස් කිරීමත් සිදුවිය. 1948 ට පෙරත් මේ සඳහා යම් යම් පෙළඹවීම් හඳුනාගත හැකි වු අතර පළමු ලෝක යුද්ධයේ දුර්විපාක මග හැරවීම හා නැවත එවන් තත්ත්වයන් ලෝකය තුල ඇති නොවීමට වගකියන සංවිධානයක් පිහිටුවා ගැනීමට ලෝක බලවතුන්ට අවශ්‍ය විය. ඒ අනුව ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගත් අතර යම් ගැටළුවලදී එම සංවිධානයගේ මැදිහත් වීම හඳුනාගත හැකි විය. 1924 දී ජාතීන්ගේ සංගමය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනය එළි දැක්වු අතර එම ජිනීවා ප්‍රකාශනයත් 1948 දී ප්‍රකාශයට

*ISBN 978-955-4563-72-8*

පත් කල මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයත් 1959 නොවැම්බර් 20 වන දින ජිනීවා ළමයින් පිළිබඳ කථිකාවත කරලියට ගෙන ඒමට හේතු විය.

''සමස්ත මෙම ක්‍රියාවලිය තුල 1924 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයෙන් ලද පිටුවහලන් 1948 දෙසැම්බර් ''විශ්ව ප්‍රකාශනය'' තවදුරටත් ඉදිරියට ගෙනයමින් 1959 නොවැම්බර් 20 වන දින ජිනීවා හි පැවති එක්සත් ජාතීන්ගේ මහාමණ්ඩල සැසිවාරයේ දී සඳහන් කර ඇති පරිදි ශාරීරිකව හා මානසිකව නොමේරූ අවධියක සිටීමේ හේතුවෙන් ළමයෙකුට උපතට පෙර මෙන්ම උපතින් පසුවද යෝග්‍යය නෛතික රැකවරණය ඇතුලුව විශේෂ ආරක්ෂාවන් සහ රැකවරණය අවශ්‍ය බව සහතික කෙරිනි.'' (කුමාර, 2011, පි. අ. 03)

ඊට අමතරව 1974 දී දෙසැම්බර් 14 වනදින මහා මණ්ඩලයේ සම්මත වූ හදිසි හා යුධමය අවස්ථාවල ළමුන් හා කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධ යුක්තිය පසඳලීම සඳහා වන ප්‍රකාශනය හා 1986 දී මහා මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද දරුවන් දරුකමට හදා වඩා ගැනීම පිළිබඳ ප්‍රකාශනයත් ප්‍රධාන වශයෙන් 1989 ළමා අයිතිවාසිකම් ප්‍රකාශනයට අනුබල සැපයීය.එමෙන්ම 1979 දී ජාත්‍යාන්තර ළමා වර්ෂය ලෙස නම් කිරීම හා ළමයින් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද වැදගත් විය. උක්ත සාධකවල සැළසුමක් ලෙස 1989 නොවැම්බර් 2 දා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තිය නමින් ළමුන් වෙනුවෙන්ම විශේෂිත වූ විශ්ව ප්‍රකාශනයක් එළි දැක්වීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කෙරිණි. එය ප්‍රධාන වශයෙන් වගන්ති 54 කින් විස්තර වේ.

ඒ අනුව එක්සත් ජාතින්ගේ මහා මණ්ඩලය විසින් 1989 නොවැම්බර් මස 20 වන දින සම්මත කළළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද ළමා අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධව වැදගත් නීති මූලාශ්‍රයක් ලෙස හැඳින්විය හැකිය.

''එක්සත් ජාතීන් විසින් 1989 නොවැම්බර් 20 දා සම්මත කල ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ඉතා ස්ථිරසාර වූ නීති මූලාශ්‍රයකි. තවද එය පුරා අවුරුදු දහයක් මුළුල්ලේ සාකච්ඡාවට භාජනය කිරීමෙන් අනතුරුව ජාතීන් 20 ක් විසින් ස්ථිර කරනු ලැබූ 1990 සැප්තැම්බර් 2 දින වලංගුභාවයට පත් වූ මූලාශ්‍රයකි. මේ වන විට ලෝකයේ රටවල් 190 ක් මෙම ප්‍රඥාප්තියට අත්සන් තබා ඇති අතර ශ්‍රී ලංකාව මෙම ප්‍රඥාප්තියට අනුමැතිය දුන්නේ 1991 ජූලි 12 දින දීය.ප්‍රඥප්තිය යම් රටක අනුමත කිරීමෙන් පසු එහි අඩංගු ව්‍යවස්ථා එම රටේ වලංගු නීතිය බවට පත්වේ. එක් එක් සමාජීය රටවල මෙම නීති ක්‍රියාත්මක කිරීමට කරන වැඩසටහන් රටවල් 10 ක නියෝජිතයන්ගෙන් සමවිචිත ජිනිවා කමිටුවට වාර්තා කළ යුතුය. එම වාර්තා පරීක්ෂණ කිරීම මෙන්ම එක් එක් රටවල තොරතුරු රැස්කිරීම හා සංචාරය කිරීම ආදී ක්‍රියාමාර්ග මගින් එම ජිනීවා කමිටුව ළමා අයිතීන් පිළබඳ ප්‍රඥප්තියේ ව්‍යවස්ථා ක්‍රියාවට නංවාලීමට වගබලා ගනි.මෙම ප්‍රඥප්තිය මගින් ප්‍රධාන ක්ෂේත්‍ර 4 කට අදාළළමා අයිතීන් ආරක්ෂා කිරීමට අපේක්ෂා කෙරේ. එකී කොටස් 4 නම්,

- තම පැවැත්ම සඳහා ළමයින්ට ඇති අයිතිය
- තම සංවර්ධනය සඳහා ළමයින්ට ඇති අයිතිය
- තම ආරක්ෂාව සඳහා ළමයින්ට ඇති අයිතිය
- සහභාගීත්වය සඳහා ළමයින්ට ඇති අයිතිය ''(කෝණාර, 2000, පි. අ. 93,94)

ළමා අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡා කිරීමේදී අදවන විට ලෝකයේ බොහෝ රටවල ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වෙමින් පවතියි. මෙය වර්තමානයේ සිදු වූ ක්‍රියාවලියක් ලෙස අර්ථ දැක්වීම සාධාරණ නොවේ. ලෝක ඉතිහාසය තුල ද යම් යම් ආකාරයෙන් ළමා අයිතීන් උල්ලංඝනය විය. පුරාතන හා මධ්‍යතන අවධිවල ළමයා ළමයෙකු ලෙසවත් නොසිතුහ. එම යුගය තුල අයිතිවාසිකම් රැකීමවත් එය හඳුනාගැනීමට සිදු නොවීය. ඒ සඳහා ලෝක ඉතිහාසය ඕනෑ තරම් සාක්ෂි සපයයි. මීට බොහෝ විට බලපෑවේ දිළිඳු කම හා නොදියුණු මානව සම්පතෙහි හැසිරීමයි.ඒ අනුව 1989 ප්‍රකාශිත විශ්ව ළමා ප්‍රඥප්තියේ අඩංගු ළමා අයිතිවාසිකම් ලංකාටව අදාල වනසේ ගැලපීමේ දී කොතෙක් දුරට එය අදාල වේ ද යන්න මෙහිදී විමර්ශනය කල යුතුය. මෙම අයිතීන් කඩවීමේ දී යුක්තිය පසිඳලීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

*ISBN 978-955-4563-72-8*

"ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල හා පාර්ලිමේන්තුව විසින් පවත්වනු ලබන නීති තුල මේ අයිතිවාසිකම් ගැබ්ව ඇත. පහත පහළවනුයේ එම දේශීය නීති සමහරෙකි.

- 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් අන්තර්ගත 3 වෙනි පරිච්ඡේදය.
- 1939 අංක 48 දරණ ළමුන් හා ගැටවරයින් පිළිබඳ ආඥාපනත
- 1956 අංක 47 දරණ කාන්තාවන් ළමුන් හා ගැටවරයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත
- 1956 අංක 48 දරණ ළමුන් හා ගැටවරියන් පනත
- 1959 අංක 19 දරණ නඩත්තු ආඥාපනත
- 1846 අංක 4 දරණ අයාලේ යාම පිළිබඳ ආඥා පනත
- 1889 සිවිල් නඩු විධාන සංග්‍රහ පනත
- 1942 අංක 45 දරණ කර්මාන්ත ශාලා පනත
- 1939 අධ්‍යාපන පනත
- දණ්ඩ නීති සංග්‍රහ පනත (ගුණසේකර, 2001, පි. අ. 100)

මෙම නීතිමය පසුබිම තුළළමයා සුරක්ෂිත කරලීමට ඇවැසි නෛතික පියවරයන් රජය විසින් ගන්නා ලදි. චාරිකා මාරසිංහ 1997 දී ප්‍රකාශයට පත්කල ළමා අයිතිවාසිකම් පිළිබඳ අත්පොතෙහි සඳහන් ආකාරයට ළමා අයිතිවාසිකම් ලෙස සඳහන් කර ඇත්තේ

- ජීවිතයට, පැවැත්මට සහ වර්ධනයට ඇති අයිතිවාසිකම
- උපතේදී නම හා ජාතිකත්වය ලැබීමට ඇති අයිතිවාසිකම
- දෙමාපියන් ගැන දැනගැනීමට හා දෙමාපිය රැකවරණය ලැබීමට ඇති අයිතිවාසිකම්
- දෙමව්පියන්ගෙන් වෙන් නොකිරීමට ඇති අයිතිවාසිකම
- අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිවාසිකම
- සිතීමට හෘද සාක්ෂියට හා ආගමට ඇති අයිතිවාසිකම
- සමාගමේ නිදහස හා සාමකාමී රැස්වීමේ නිදහස
- පෞද්ගලිකත්වය, පවුල, නිවාස හෝ ලියකියවිලි වලට ගරුත්වය හා කීර්තිනාමයට සිදුවන නීති විරෝධී බලපෑම්වලින් ආරක්ෂාවීමට ඇති නිදහස
- සෞඛ්‍යයට ඇති අයිතිවාසිකම්ෟ
- ප්‍රමාණාත්මක ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරාත්මක හා සමාජ සංවර්ධනයක් සඳහා ප්‍රමාණවත් වූ ජීවන තත්ත්වයකට ඇති අයිතිවාසිකම
- අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම
- විවේචනයට හා ක්‍රීඩා කිරීමට ඇති අයිතිවාසිකම
- ආර්ථික සූරාකෑමෙන් ආරක්ෂාවීමට ඇති අයිතිවාසිකම
- ලිංගික සූරා කෑමෙන් ආරක්ෂාවීමට ඇති අයිතිවාසිකම්
- හානිකර වැඩවල යෙදවීමෙන් ආරක්ෂා වීමට ඇති අයිතිවාසිකම
- වදහිංසා හෝ කෲර අමානුෂික හෝ පහත් මට්ටමේ සැලකීම් හෝ දඩුවම් වලින් මිදීමට ඇති අයිතිවාසිකම්
- සාධාරණ නඩු විභාගයට ඇති අයිතිවාසිකම
- නිදහස හා සුරක්ෂිත භාවයට ඇති අයිතිවාසිකම(ගුණසේකර, 2001, පි. අ. 100, 101)

**ළමා අපයෝජනය සඳහා බලපාන සාධක, නීතිමය පසුබිම හා වලක්වාගත හැකි ක්‍රම**

ළමා අපයෝජනයක් යනු ඒ ඒ සමාජ සංස්කෘතීන්ට අනුව ළමයාගේ අධ්‍යාපනයට පෞරුෂය වර්ධනයට යහපත් සමාජානුයෝජනයට හිතකර නොවන ඕනෑම ක්‍රියාවලියක් වේ. එය ළමයා විසින් සිදු කරන ලබන ක්‍රියාවලියකි. අපචාර හා අපයෝජනය යන්නෙන් වෙනසක් ඇත. අපයෝජනයක් යනු යම් පුද්ගලයෙකු හෝ සමූහයක් විසින් ළමයින්ව වැරදි ක්‍රියාවලට පොළඹවා ගැනීමයි. ළමයින්

ISBN 978-955-4563-72-8

විසින් වැරදි ක්‍රියාවලට යොමුවීම අපචාරයක් ලෙස හඳුන්වයි .අපයෝජනයට ලක් වූ දරුවකු ඊළඟ වතාවේදී අපචාරයකට පෙළඹිය හැකිය.

ළමා අපචාර සම්බන්ධව සාකච්ඡා කිරීමේදී මූලික වශයෙන් එය පහත පරිදි හඳුනාගත හැකිය.

ළමා අපචාර →
- සන්නිවේදන මාධ්‍ය වැරදි භාවිතය හා ලිංගික අපචාර
- සොරකම්, මිනීමැරුම්, මංකොල්ල කෑම් හා අවි ආයුධ භාවිතය
- මත්ද්‍රව්‍ය භාවිතය
- වෙළඳාම / වීදී දරුවන්

ඉහත සඳහන් පරිදි ළමා අපචාර ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. එහිදී ලිංගික අපචාර හා සන්නිවේදන මාධ්‍ය වැරදි භාවිතය ළමා අපචාරයන් ලෙස හඳුනාගත හැකිය. දියුණු තාක්ෂණික රාමුවක් තුල පරිගණක භාවිතය හා ජංගම දුරකථන භාවිතය ඉහළ ගොස් ඇත. ඒ හේතුකොට ගෙන ළමුන් ලිංගික දර්ශන ඇතුලත් චිත්‍රපට වීඩියෝපට නැරඹීම තුල මානසික විකෘතිතා මෙන්ම කායික වශයෙන් ද වැරදි ලිංගික හැසිරීම් වලට ඇබ්බැහි වීම ද දක්නට ලැබේ. දරුවන් අතර ප්‍රබල ලෙසට දක්නට ලැබෙන සංසිද්ධියක් වන්නේ සමාජ වෙබ් අඩවි භාවිතයයි. එනම් Facebook" Twitter" My Space වැනි සමාජ වෙබ් අඩවි හරහා අසභ්‍ය දර්ශන නැරඹීම සහ දරුවන් මේ සඳහා ඉලක්ක කර ගෙන ඇත. එවන් දර්ශන මිත්‍ර කණ්ඩායම් අතර හුවමාරු කර ගැනීම ද දැකිය හැකිය. නව යොවුන් වියේ දරුවන් අතර පවතින ලිංගිකමය කුතුහලය හා ඒ සඳහා ඇති පෙළඹවීම මාධ්‍යය මගින් අවභාවිතා කරමින් දරුවන්ව මානසිකව අපයෝජනයට ලක් කිරීමට ක්‍රියාකර ඇත.

එමෙන්ම ළමා ගණිකා වෘත්තිය මුලිකවම අපයෝජනයක්ව පසුව ළමා අපචාරයක් ලෙස සමාජ ගතවේ. එය බොහෝ විට සංචාරක කලාප ආශ්‍රිතව හඳුනාගත හැකිය. සමලිංගික ක්‍රියා හා ව්‍යභිචාර ගණයේ ලිංගික ක්‍රියා ද ලිංගික අපචාර ගණයට අයත් වේ. පාසල තුල සමවයස් කණ්ඩායම් ඇසුර විශේෂයෙන් බාලක බාලිකා වශයෙන් වර්ගීකරණය වී හුදකලා වූ පාසැල් රටාව තුල සමලිංගික ක්‍රියාවල හැසිරීම් වාර්තා වේ. අසභ්‍යය වීඩියෝ පට අලෙවිය ජනප්‍රිය වී ඇත්තේ ද මෙම ළමා පරපුර අතරේය. එමෙන්ම ළමයින් එවන් අසභ්‍යය චිත්‍රපට දර්ශන සඳහා යොදා ගැනීම ද හඳුනාගත හැකිය. ලිංගික අපචාර වලට යොමු වන ළමුන් බහුල වශයෙන් ජනාකීර්ණ ප්‍රදේශවල විශේෂයෙන් මුඩුක්කු පැල්පත් ආශ්‍රිතව දැකගත හැකිය. අඩු ඉඩකඩ ඇති සංකීර්ණ වටපිටාවක් තුළ වැඩිහිටියන්ගේ ලිංගික හැසිරීම් දැකීම හා රූපවාහිනී මාධ්‍යය භාවිතය මෙම පෙළඹවීමට ප්‍රධානම හේතුවයි.

තව ද නිසි වයස තුල අධ්‍යාපනයට යොමු නොවූ දරුවා සමාජීය වශයෙන් විවෘත වීමක් සිදු වීමෙන් ලබන සමාජ ආභාෂය තුල ඇතිවන කම්පනය ඔවුන් සාධාරණීකරනය කර ගන්නේ ලිංගික ආශ්වාදය තුලිනි. දුගී බව තුල නිවාස, ඇඳුම් පැළඳුම් අධ්‍යාපනය වැනි අවශ්‍යතා අහිමි වීම නිසා අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වූ දරුවා අසම්මත ක්‍රියා තුළ සතුටුවනවා විය හැකිය.

විවෘත ආර්ථිකයක් සමග ලංකාව තුල මත්ද්‍රව්‍ය භාවිතය ජනප්‍රිය වූ අතර ළමුන් අතර බොහෝ විට යොමු වී ඇත්තේ දුම්වැටි , ගංජා , මත්පෙති, මදන මෝදක ,බුලත් විට වැනි පහසුවෙන් මිල දී ගත හැකි මත්ද්‍රව්‍ය සඳහාය. දරුවන් මත් ද්‍රව්‍ය සඳහා යොමු වන්නේ විලාසිතාවක් වශයෙනි. ඔවුන් අනුකරණය කරන්නේ වැඩිහිටියන්ය. එමෙන්ම වැඩිහිටියන්ගේ මත්ද්‍රව්‍ය අලෙවි ව්‍යාපාර වල ඔත්තුකරුවන් වන්නේ දරුවන්ය. ඒ ඔවුන් පොලීසිය හා නීතිය සම්බන්ධ ආයතන විසින් සැක නොකරන බැවිනි. දුම්වැටි වලට බොහෝ දරුවන් යොමු වීමට නිවසේ පරිසරය බලපායි. පියා දුම්වැටි පානය කරන නිවසක දරුවන්ද ඊට යොමු වීමට ඇති ඉඩකඩ වැඩිය. තවද සමවයස් කණ්ඩායම්වලදී එකිනෙකා පරයා යන ශක්තීන් උරගා බැලීමට පෙළඹීමේ දී තම සමූහයෙන්

***ISBN 978-955-4563-72-8***

මතුවීමට උත්සාහ කරන දරුවා සුවිශේෂී පුද්ගලයෙකු වීම සඳහා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වේ.සමාජය තුල ළමා අපචාර සංසිද්ධීන් අතර සම්බන්ධතාවයක් ඇත. එහිදී සොරකම් කිරීම්, මංකොල්ලකෑම්, මිනිමැරීම් සම්බන්ධ අපචාර ක්‍රියාවලට යොමු වීම දක්නට ලැබේ. මෙම ක්‍රියා වලින් එකිනෙකා හා සම්බන්ධ වේ. එහිදී මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹුනු ළමයෙක් ඒ සඳහා අවශ්‍ය මුදල් සෙවීමට සොරකම් කිරීමට හැකිය. ළමුන් සොරකම් හා මංකොල්ලකෑම් වැනි ප්‍රචණ්ඩ ක්‍රියා වලට යොමු වීමට ළමා කාටුන් හා චිත්‍රපට හා නාට්‍යවල සඳහන් විවිධ ක්‍රියාවන් ද බලපෑම් කරන බව ළමා මනෝ විද්‍යාඥයන්ගේ මතයයි.

ශ්‍රමය විකිණීම හා සම්බන්ධව බොහෝ විට දරුවන් යොමු වන්නේ දුගී බව නිසාය. අඩු පිරිවැයකට බොහෝ විට වැඩි වැඩ කොටසක් කිරීමට ඔවුන්ට සිදුවේ. එහිදි තමන්ට අවශ්‍යය පහසුකම් සපයා ගැනීමට විවිධ හේතු මත පාසල් කාලය අහිමි වීම නිසා ඇති වන සමාජ හුදකලාබව, දුගීබව මෙම පෙළඹවීමට හේතු වන සමාජ කාරකයන් ය.ළමා අපයෝජනය යනු වැඩිහිටියන් විසින් ළමුන්ව වැරදි ක්‍රියාවලට පෙළඹවීමයි. 1989 ළමා අයිතිවාසිකම් ආඥාපනත අනුව ළමා අපයෝජනය ළමයින්ට සිදුවන කරදර අකටයුතුකම් යන්න සඳහන් කර ඇත.

- ළමයින් යුද කටයුතු වලට යොදා ගැනීම.
- වහල් සේවයට හෝ මෙහෙකාර සේවයට ශ්‍රම සූරාකෑමට ලක් කිරීම හෝ එසේ වීමට ඉඩ හැර සිටීම.
- අන්තරායක වැඩ කටයුතු වලට කර්මාන්ත වලට වෘත්තීයන්ට (රැකියා හෝ ශ්‍රම ලබා ගැනීම) ව්‍යාපෘතින්ට යොදා ගැනීම (උස් ස්ථාන, යන්ත්‍ර සූත්‍ර, විදුලිය, ජලය, ගින්දර) අවධානම් වැඩ හෝ නීති විරෝධී
- දරුකමට හදා වඩා ගැනීමට දීම හෝ වහල් සේවයට මෙහෙකාර හෝ ගණිකා සේවයට විකිණීම.
- මත්ද්‍රව්‍ය මත්පැන් වලට හුරුවීම.
- අන්තරායක අවි ආයුධ පරිහරණය භාවිතයට හුරු කරවීමට හෝ එසේ වීමට ඉඩ හැර සිටීම.
- මත්ද්‍රව්‍ය හොර ජාවාරම්, නීති විරෝධි කටයුතු වලට යොදාගැනීම හෝ පුහුණු කිරීම එසේ වීමට ඉඩ හැර සිටීම
- කෲර ලෙස ශාරීරිකව ද මානසිකවද හිංසා කිරීම.
- නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමට බාධා කිරීම හෝ ඉඩ ලබා නොදීම.
- ලිංගික කටයුතු වලට කැමැත්තෙන් හෝ බලහත්කාරයෙන් යොදා ගැනීම.
- ලිංගික කටයුතු වලට පෙළඹවීමට පෙළඹෙන ලෙස කැමැත්තක් ඇති වන ලෙස ස්පර්ශ කිරීම, සිපවැලඳ ගැනීම, අසභ්‍යය රූප සඟරා හෝ චිත්‍රපට නැරඹීමට සැලැස්වීම හෝ පුද්ගලයෙකුගේ නිරුවත ළමයෙක්ට පෙන්වීම හෝ ස්පර්ශ කිරීමට දිම හෝ ඉඩහැර සිටීම දරුවන්ට දර්ශනය වන ලෙස ලිංගික ක්‍රියාවල නිරතවීම.
- ළමයෙකු අවධානමට ලක් වන ලෙස ආත්මගරුත්වය කෙලෙසන ලෙස උසුළු විසුළු කිරීම, බැන වැදීම, අපහාස කිරීම හෝ නිරුවත් කිරීම.
- ළමයෙකුගේ ස්වාධීනත්වය, නිදහස, අභිමිකරවීම, සිරකර තැබීම ,යදම් වලින් බැඳ තැබීම.
- නිසි ලෙස ආහාර, ඇඳුම්, සෞඛ්‍ය පහසුකම් ලබානොදීම.
- සම වයසේ මිතුරු ඇසුරට, ක්‍රීඩාවට විනෝද වීමට ඉඩ නොදී බාධා කර හුදකලා කිරීම.
- මව්පියන්ගෙන් සහ ඔහුට හා ඔහු ආදරය කරන අයගෙන් වෙන් කිරීම.

(කුරේ, 2005, පි. 18-19)

උක්ත කරුණු අනුව ළමා අපයෝජනයට බලපාන සාධක විවිධ මුහුණුවරින් හඳුනාගත හැකිය. ළමා අපයෝජනය පිළිබඳ සාකච්ඡා කිරීමේදී එය නූතන සමාජය තුල සමාජ වෙනස්වීම තුල ඇති වූ සමාජ විසංවිධානකාරී වීම යැයි අනම්‍යය මතයක පිහිටිය නොහැකිය. මන්ද ලෝක ඉතිහාසය තුළ පුරාතන හා මධ්‍යයතන යුගය තුළළමයින්ව දරුණු ලෙස ප්‍රීඩාවට පත් වූ බව වාර්ථා වේ. නමුත් එකල ළමයින් වෙනුවෙන් ලෝක මට්ටමින් පිළිගත් ප්‍රකාශයක් නොමැති වීම ළමා අපයෝනයක් ලෙස නිර්වචනය නොවීමට බලපෑවේය. ලොව ගෝත්‍රික සමාජය තුළ දරුණු ලෙස ළමා ලිංගික අපයෝජනයක් සිදුවිය. ශිෂ්ටාචාර ගත නොවූ ම්ලේච්ඡත්වය තුල ගැහැණු දරුවන් වයස්ගත

*ISBN 978-955-4563-72-8*

පිරිමින්ට විවාහකර දීම, සමූහ විවාහයන් තුල සොයුරු සොයුරියන් අතර පැවති සබඳතා ,මිත්‍යා විශ්වාස තුල කුඩා දරුවන් බිලි දීම, එකල බහුලව දක්නට ලැබුණු බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි.

''ඉතිහාසයේ ළමා අපයෝජන යනුවෙන් කිසිවක් හඳුනාගෙන නොතිබිණි. ළමයින් යනු සුවිශේෂී පිරිසක් කියා හෝ වැඩි අවධානයක් පෙනෙන්නට නොවීය. ඉතිහාසයේ ඈත යුගවල දී පවා දරුවන් වහල් සේවයට මෙහෙකාර සේවයට බිලි පූජා වලට බිලිදී මරණයට පත් කිරීමට ලිංගික කටයුතු වලට අවදානම් වූ සතුන් දඩයමට යුධ කටයුතු වලට ආදී විවිධ අපයෝජන වලට යොදා ගත් බවට කරුණකි. ඒ යුගයේ ද සැප පහසුවෙන් නිදහසේ කල් ගෙවූයේ වර්තමානයේ ධනවත් පවුල්වල දරුවන් මෙන් ගෝත්‍ර නායකයන්ගේ ළමයින් පමනි. එසේම ඒ යුගවල නීතිරීති හා නඩුහබ වලදී ළමයින් වෙන් කර විනිශ්චය කිරීමක් නොතිබිණි. වරදක් සිදුවූ විට හෝ සිදු කල විට ළමයින්ට ද වැඩිහිටියන් මෙන් දඬුවම් දීම සාමාන්‍යය දෙයක් වී තිබිණි. එම දඬුවම් අතරට පිටුවහල් කර හැරීම මගින් දරුවාගේ ආරක්‍ෂාව අනතුරට පත් කිරීම දරුවා නැතිකර දැමීම , ඔහුට හෝ ඇයට කල නොහැකි අපහසු වැඩ පැවරීම, බොහෝ කාලයක් අපරිසිදු අනාරක්ෂිත අඳුරු ස්ථානවල සිරකර තැබීම, මරණයට පත් කිරීම හෝ කස පහර දීම යම් ස්ථානයක දින ගනන් අත් පා බැඳ තැබීම ආදී ඒ ඒ ග්‍රෝත්‍රවලට ආවේණික දඬුවම් ක්‍රම ළමයින්ටද ලබාදුන් බව ඉතිහාසයේ සාක්ෂි ඇත.''(කුරේ, 2005, පි. අ. 23)

සමාජ නවීකරණය, නාගරීකරණය වැනි සමාජ වෙනස්වීම් කාරක හේතුකොට ගෙන ළමා අපචාර හා අපයෝජනයක් වැඩි වූයේ ද යන සමාජ මතය බැහැර කිරීමට උක්ත සාධක ප්‍රමාණවත් ද යන සැකය පවතියි.

''මින් මෙහෙකාර සේවයට ,සිගමනට, ගණිකා සේවයට යොදා ගන්නා ළමුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් දැකීමට නොහැකි වුවත් වැඩි ප්‍රතිශතයක් ළමුන් ගණිකා සේවයට යොදවන හා යෙදෙන බව නොරහසකි. එයිනුත් වැඩි ප්‍රමාණයක් පිරිමි ළමුන් වන අතර එය එසේ වන්නේ ගණිකා සේවය ළමුන්ට ඉතා ලෙහෙසි සහ පහසු ආදායම් මාර්ගයක් බවට පත් වී ඇති නිසාවෙනි. ඉන්දියාව, බංගලාදේශය, තායිලන්තය, ශ්‍රී ලංකාව වැනි රටවලත්, ආසියාතික වෙනත් රටවලත්,ළමා ගණිකා ව්‍යාපාරය බහුල වී ඇති අතර, එය එසේ වී ඇත්තේ සංචාරක ව්‍යාපාරය පදනම් කොටගෙනය. තායිලන්තයේ මේ වන විට ලාබාල දැරියකගේ කන්‍යාභාවය ඉතා අධික මිලකට අලෙවි කිරීමට තරම් මව්පියන් පෙළඹී ඇති අතර ගණිකා සේවය ඉතා පහසු ආදායම් මාර්ගයක් බවට පත්ව ළමා ගණිකා පාරාදීසයක් බවට පත්ව ඇත.''(කුරේ, 2005, පි.අ. 26)

දරුවන්ට මෙලොව දකින්න තිබෙන අවස්ථාව අහිමි කරමින් ගබ්සා කිරීම ද, බාල වයස්කාර විවාහයන් ද ,දරුවන් බිලි පූජා හා අනෙකුත් අභිචාර සඳහා බිලි දීමද ,වහල් සේවයේ යෙදවීමද,ළමා අපයෝජනයන් ලෙස ලෝකයේ දකින්ට ලැබුණු සහ තවදුරටත් හඳුනාගත හැකි සිදුවීම්ය. මෑත කාලීනව ලංකාව තුල ළමා අපයෝජනයන් පිළිබඳ විශාල කථිකාවතක් ගොඩනැගී ඇත. ඒ සඳහා විද්වතුන් ,සමාජ විද්‍යාඥයින්, විවිධ හේතු ගෙන හැර දක්වයි. නමුත් ලංකා ඉතිහාසය තුල ළමා අපයෝජනයන් ලෙස වර්ගීකරණය නොවූ , නාමකරණය නොවූ , අපයෝජනයන් හඳුනාගත හැකිය. එකල ගැහැණු දරුවකු වැඩි වියට පත් වූ සැනින් විවාහ කර දීම ,එක් අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. සාමාන්‍ය ගැහැණු දරුවකු වැඩිවියට පත්වන වයස අවුරුදු 13, 14 පමණ වේ. නමුත් ද්විතියික ලිංගික ලක්‍ෂණ පහල වීම හා වැඩිවියට පත් වීම යන, ශාරීරික ක්‍රියාදාමය තුලත් , අධි සමාජ වගකීම් ඉසිලිය හැකියි යන මතයෙහි පිහිටා ළමා කාලය අහිමි කිරීම කෙතරම් ශිෂ්ට සම්පන්න ද යන්න ගැටළු සහගත වේ. පුරුෂාධිපත්‍යය තුල පෝෂණය වූ ලංකා සමාජයට බොහෝ ආදර්ශයන් ලැබුනේ බ්‍රාහ්මීය මත වලින් පෝෂණය වූ ඉන්දීය සංස්කෘතිය තුලිනි. එම සමාජය තුල ගැහැණු දරුවා මහත් පීඩාවට පත්විය.

වැඩවසම් සමාජ ලක්‍ෂණ වලින් පෝෂිත රාජ්‍යය පාලන සමය තුල දැරිවියන් රජු හා රදළ පන්තියේ පිරිමින්ගේ ලිංගික ගොදුරු බවට පත්විය. ඒ අනුව රූමත් දියනිවරුන් ලැබීම දිළිඳු දෙමව්පියන් මහත් අවාසනාවක් සේ සැලකීය. තෘතීය වැඩවසම් ක්‍රමය තුළ දියණිවරු පමණක් නොව පුතණුවරුන්ට ද බොහෝ සමාජ පීඩාවන් එල්ල විය. සමාජ වරප්‍රසාද භුක්ති විඳී රදළ පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් ළමා කල සිටම තම කය වෙහෙසීය. එපමණක් නොව අතීත කෘෂිකාර්මික පරිසරය තුල දරුවන් අභ්‍යාසලාභී ගොවියන් විය. විෂය ශාස්ත්‍ර ආදී ඉගෙනුම රජු හා රදල පන්තියට පමණක් සීමා විය.

ISBN 978-955-4563-72-8

එමෙන්ම නිධන් ලබා ගැනීමේදී බිලි පූජා පැවැත්වීම සඳහා දරුවන් මැරීම, එමෙන්ම පලි ගැනීම් සඳහා දරුවන් මරා දැමීම ද ඉතිහාසය තුල සටහන්ව ඇත. නිදසුනක් ලෙස ඇහැලේපොළ අධිකාරම්ගෙන් පලි ගැනීම සඳහා ඔහුගේ බිරිඳ හා දරුවන් මරා දැමීම දැක්විය හැකිය. මද්දුම බණ්ඩාරගේ කථා පුවත මෙහිලා ප්‍රසිද්ධ පුවතකි. යුරෝපා ආක්‍රමණික පාලන සමය තුල තාඩන පීඩන වලට ළමුන් ලක් වු අතර 1948 නිදහස ලැබීම 1977 විවෘත ආර්ථික සංකල්පය හඳුන්වාදීම වැනි කාරණා හේතුකොට ගෙන මෙරට තුල ළමා අපයෝජනයන් ප්‍රබල ලෙස ව්‍යාප්ත විය.

''70 දශකය වෙත පැමිණෙන විට රදළ ආධිපත්‍යය බිඳී ලිංගික සූරා කෑම් ළමා ශ්‍රමය සූරාකෑම් අවම වෙමින් නිදහස් අධ්‍යාපනයේ අස්වැන්න ලැබී තිබිණ. දුප්පත් දරුවන් අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ලබා දේශපාලනයට පවා පිවිසෙමින් තිබිණි. එසේම ගොවිතැනින් ජීවත් වූ අය ඒවා අතහැර රැකියා හා වෙළඳාමට හුරු වීම මතද සමාජයේ වෙනස්කම් සිදුවිය. මේ වෙනස්කම් මත සමාජයේ වෙනස් ආකාරයේ ළමා අපයෝජන පහල මට්ටමක පැවතියේ නමුත් 70 යුගයේ දේශපාලන වෙනස්කම් හා 77 විවෘත ආර්ථික රටාවට ශ්‍රී ලංකාව විවෘත වීම සමඟ සංචාරක ව්‍යාපාරය හා තරඟකාරී සමාජ රටාව මගින් පෙර නොවූ විරූ ලෙස ළමා අපයෝජනයන් වැඩි වන්නට විය. ළමා ලිංගික අපයෝජනය, ගණිකා සේවය, මෙහෙකාර සේවය ,දරුකමට විදේශිකයන්ට ළමයින් විකිණීම මහ මඟ දරුවන් හැර යාම, ධනවත්ළමයින් පැහැරගෙන කප්පම් ඉල්ලීම, දැරිවියන් දූෂණය කර මරා දැමීම, මත්ද්‍රව්‍ය ළමයින් අතර බෙදා හැරීම වැනි කිසිදා ශ්‍රී ලංකාවේ සිදු නොවූ අපයෝජන ක්‍රියාවලියක් විවෘත ආර්ථික රටාව යටතේ විවර විය (කුරේ, 2005, පි. අ. 31). උක්ත සඳහන් කරුණු අනුව පෙනී යන්නේ ළමා අපයෝජනයන්ගේ අපචාරයන්ගේ දිශානතිය වෙනස් වී ඇති බවයි. බොහෝ විට එය සිදු කෙරෙන ආකාරය හා ළමයින් එයට පොළඹවා ගන්න කරනු ලබන ක්‍රියාමාර්ග ද නවීකරණ සාධක වලට සාපේක්ෂව වෙනස් වී ඇත.

ළමා අපචාරයන් මෑත කාලීනව සිදු වීමට බලපාන සාධක කිහිපයකි.

1. මාධ්‍යය අවභාවිතය
2. දරිද්‍රතාවය
3. පශ්චාත් යුධ සමය
4. දෙමව්පියන් විදෙස්ගත වීම
5. පලිගැනීම් හා කප්පම් සඳහා දරුවන් පැහැර ගැනීම
6. බාරකරුවන්ගේ නොසැලකිල්ල
7. පවුලේ ව්‍යුහය හා කාර්යභාරයන්ගේ වෙනස්වීම
8. සමාජය තුල අනෝමියත්වය බිඳ වැටීම
9. සමාජ ගත නොවූ ලිංගික අධ්‍යාපනය පිළිබඳ කුතුහලය
10. මානසික ව්‍යාධීන් සහිත රෝගීන්ගේ ප්‍රමාණය ඉහළ යාම

**1. මාධ්‍යය අවභාවිතය**

ළමා අපයෝජනයට මාධ්‍ය සඳහා වරදින් වැඩි කොටසක් පැවරේ. සමාජ වෙබ් අඩවි හරහා බෙදා හරින අසභ්‍යය දර්ශන තුලින් මෙන්ම නිල් චිත්‍රපට හරහා ද ළමා මනස දූෂණය වේ. වාර්තාවන අන්දමට යොවුන් විය තුල පවතින ලිංගික කුතුහලය නිසාම ඔවුන් ජංගම දුරකථන භාවිතයෙන් ලිංගික ක්‍රියා ඇතුළත් දර්ශනයන් නැරඹීම සිදු කරයි. බොහෝ පාසල් දරුවන් අපචාර සඳහා යොමුවන්නේ පවතින නොදැනුවත් බාවය නිසාය.මෑත කාලීනව දක්නට ලැබුණු ප්‍රවණතාවය නම් ළමා අපයෝජනයන්ගේ රැල්ලක් ඇති වීමයි. ඒ සඳහා සෘජුවම මාධ්‍යය වගකිව යුතුය. දරුවන් අපයෝජනයට ලක්වන ආකාරය එහි ස්වභාවය පියවරයන් සිය මාධ්‍යය ජනප්‍රියතාවය උදෙසා පාඨකයන් නරඹන්නන් සහෘදයන් මාධ්‍යය ජාලය තුලට වඩාත් ආකර්ශනය සඳහා ඇඳ බැඳ තබා ගැනීමට සුදුසු ලෙස ඉදිරිපත් කිරීම මෙහිලා වරදකි. මෙවන් දේ ඇසීම, දැකීම හෝ කියවීම තුල විපරීත කාමුක ආශාවන් ඇති මානසික ආබාධයන් ඇති අය අපයෝජන ක්‍රියාවලීන්ට පොළඹවයි.

මේ තත්ත්වය වැලැක්වීමට නම් රාජ්‍යය මැදහත් වීමෙන් මාධ්‍යය භාවිතය සඳහා පවතින නීතිමය තත්ත්වයන් වෙනස් කල යුතුය. ඒ වෙනුවට දරුවන් සුරක්ෂිත කල යුතුය යන්නත් දරුවන්ට සිය ආරක්ෂාව සඳහා අපයෝජනයන්ගේ ස්වභාවය හා එය ලක්වන අවස්ථා හා ඉන් ගැලවීමට අනුගමනය කල යුතු උපක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාධ්‍යය හරහා ප්‍රචාරය කිරිම හා

*ISBN 978-955-4563-72-8*

ළමා අපචාරයන් වැලැක්විය යුතුය යන ජනමතය සමාජගත කරලීම තුල සමාජයේ ළමයා පිළිබඳව පුළුල් කථිකත්වයක් ගොඩනැගිය හැකිය.

**2. දරිද්‍රතාවය**

ළමුන් ප්‍රධාන වශයෙන් අපයෝජනයට ලක්වීමට තුන්වන ලෝකයේ රටවල පවතින දරිද්‍රතාවය ප්‍රධාන ලෙස බලපා ඇත. විශේෂයෙන් දුගීබව හා ඒ වටා ගොඩනැගුණු සංස්කෘතිය, නාගරික පැල්පත්වාසීන් ප්‍රමාණය වැඩිවීම, මෙම තත්ත්වයට පසුබිම සකස් කරයි. දූෂණයට ලක්වන දරුවන් බහුතරය නිර්ධන පන්තියට අයත් වේ. මෙහිදී මව විදෙස් ගතවීම, දරුවන් කුඩාකල සිටම පවුල් බර කරට ගැනීම සඳහා පවුලේ ආදායම් සරිකරලීමට විවිධ අදායම් උපයන ක්‍රියාවලීන්හි නිරත වීම, එනම් ළමා ගණිකා වෘත්තිය මත්ද්‍රව්‍ය අලෙවිය හා අනෙකුත් ව්‍යාපාර සඳහා දරුවන් යොදා ගැනීම හා යොමු වීම මෙහිලා සැලකිය හැකිය.ලිංගික රෝග සම්ප්‍රේෂණය අවම වීම හා ග්‍රාහකයන්ගේ තෘප්තිය ඉහළ මට්ටමකට ලගා කරවීමට ළමයාට හැකි බැවින් ළමා ගණිකා වෘත්තියට වැඩි තැනක් හිමිවේ. මේ තුල ළමයාගේ අනාගතය අඳුරට ඇද වැටෙන අතර ළමා කාලය ඔහුට හෝ ඇයට අහිමි වීම හා මානසික බිඳ වැටීම දරුවාගේ පෞරුෂ සංවර්ධනයට සෘජුවම බලපායි. දුෂ් සමාජානුයෝජනය තුල අපරාධකාරී මානසිකත්වයක් ඇති පුද්ගලයකු සමාජගත වීම සමාජ පර්යාය බිඳ වැටීමට ප්‍රධාන වශයෙන් බලපාන අතර දුගී බව තුල හට ගන්නා සමාජ පරිසරය මෙයට වගකිව යුතුය.

දරිද්‍රතාවය හේතුකොට ගෙන දරුවන් මෙහෙකාර සේවයේ යෙදවීම තුල බොහෝ ගැහැණු දරුවන් සිය ස්වාමියාගේ ලිංගික සංතෘෂ්ටිය සඳහා ද ගොදුරක් බවට පත් වේ. මෙය මධ්‍යම හෝ ධනපති පන්තිය තුල සිදුවන බැවින් අපයෝජනය සමාජගත වීම, ධනවතුන්ගේ ධනය, බලය යන සාධක හේතුවෙන් වැලකී ඇත. එනම් වාර්තා නොවන ළමා අපයෝජනයන් බොහෝමයක් සමාජය තුල යටපත් වී ඇත. දුප්පත් පවුල තුල නිරන්තරයෙන් පවතින අඩදබර හා සමාජ පරිසරය දරුවන්ගේ මානසික බිඳ වැටීමට හා ඔවුන් විඳින පීඩාවන් දරුවා තුල කුඩා කල සිටම සමාජය කෙරෙහි වෛරයක් ජනිත වීමට හා ඒ තුල මානසික ආතතිය හා ව්‍යාධීන් සහිත දරුවන් සමාජ ගත වීම ද ළමා අපචාර හා අපයෝජනයන් ගේ වැඩිවීමට රුකුලත් වී ඇත.

**3. පශ්චාත් යුධ සමය**

ලංකාව තුල මෑත කාලීනව අපරාධ රැල්ලේ වර්ධනය සඳහා පශ්චාත් යුධ සමය ප්‍රධාන වශයෙන් බල පා ඇත. 30 වසරක යුද්ධයක් තුල සිදු වූ මිනී මැරීම්, දේපල විනාශ කිරීම් වැනි අපරාධකාරී මානසිකත්වය, සෘජුව හෝ වක්‍රව මිනිස් ජීවිතවල අගය පහල දැමීමට දායක විය. ඒ සමගම සමාජ ගත වූ අපචාරයන්ගේ ප්‍රතිපල අද ද සමාජය තුල හඳුනාගත හැකිවිය. ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය අවි ආයුධ සංසරණය යුධ ළමා සොල්දාදුවන් බිහිවීම හා යුද්ධය හේතුවෙන් ඇති වූ විරුද්ධ පාර්ශව කෙරෙහි වෛරය හා පලිගැනීමේ චේතනා සමාජය තුල අපරාධකාරී පරිසරයක් නිර්මාණය කිරීමට බලපෑහ. එමෙන්ම යුධ සමය තුල මාධ්‍ය මගින් යුධ පුවත් අනාවරණය කල අතර මාධ්‍යය භාවිත සංස්කෘතිය තුල ග්‍රාහකයා හුරු වුයේ ද යුද්ධය හේතුවෙන් වාර්තා වන හානි හා මරණ ගණන ඇසීමට හෝ නැරඹීමටය.යුද්ධයෙන් පසු යුධ පුවත් නොමැති වුවත් ග්‍රාහක ආකාර්ශනය සඳහා පුවත් මැවීමට හා ළමා අපයෝජනයන් රසවත්ව මාධ්‍යය මගින් ප්‍රචාරය කිරීම ද පශ්චාත් යුධ සමය තුළ හඳුනාගත හැකි විය. මේ තත්ත්වය පශ්චාත් යුධ සමය තුළළමා අපයෝජනය වීම් ඉහළ යාමට හේතුවිය.

**4. දෙමව්පියන් විදේශගත වීම**

ළමුන් බොහෝ විට අපයෝජනයට ලක් වන්නේ දෙමව්පියන් විදේස්ගත වීම තුලිනි. විශේෂයෙන් මවගේ රැකවරණය අහිමි වීමෙන් විසංවිධානකාරී වන පවුල් සංස්ථාව තුල ළමයාට ළමා භූමිකාව අහිමිවන අතර සමහර අවස්ථාවල වැඩිමහල් දියනියක් නම් මවගේ භූමිකාව රඟ පෑමට සිදු වේ.සමහර අවස්ථාවල පියාගේ හෝ අසල්වාසී සල්ලාලයන්ගේ ලිංගික අවශ්‍යතා ඉටුකර දීමට ද සිදුවේ. ඒ සමගම දරුවාගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය මානසික නිදහස යන අයිතීන්ද උල්ලංඝනය වීම හා දරුවා පවුල තුල නිසි සමාජානුයෝජනයට ලක් නොවීම ද සමාජය තුලින් හඳුනාගත හැකිය.

ISBN 978-955-4563-72-8

**5. පලිගැනීම් හා කප්පම් සඳහා දරුවන් පැහැර ගැනීම්**

මෑත කාලීනව බොහෝ මාධ්‍යයන් වාර්තා කල පරිදි ළමා අපයෝජනයන් හා ළමා මරණ වලට ප්‍රධානම හේතුව පලිගැනීමයි. වැඩිහිටියන් අතර පවතින ආරවුල් මතභේදයන්ගෙන් පලිගන්නට දරුවන් යොදා ගැනීම හඳුනාගත හැකිය. එමෙන්ම කප්පම් කල්ලි හා පාතාලය විසින් දරුවන් පැහැරගෙන මුදල් ලබා ගැනීම තුල දරුවන්ව අපයෝජනයට ලක්වේ.

**6. බාරකරුවන්ගේ නොසැලකිල්ල**

ළමා මරණ, පැහැර ගැනීම් හා දූෂණයට ලක්වීම් සඳහා දෙමව්පියන්ගේ නොසැලකිල්ල හා දරුවන් කෙරෙහි පවතින අවධානය අඩු වීම හඳුනාගත හැකිය. මෑත කාලීනව වාර්තා වූ මරණයන්ට හා බරපතල අපයෝජනයන්ට ලක් වූ බොහෝ ළමයින් එසේ වී ඇත්තේ දෙමාපිය අවධානය යොමු නොවූ මොහොතය. බොහෝවිට දරුවන් අපයෝජනයට ලක්වන්නේ පාසල ක්‍රීඩා පිටිය, වෙරළ තීරය, ලඳු කැලෑ, පාළු ස්ථාන, පාළු පාරවල් අසල්වාසී නිවාස, ඥාති නිවාස, බස් නැවතුම් වල , තමන්ගේ නිවාස, පූජ්‍ය ස්ථානවල, පාසල් වැන් රථ වැනි ස්ථාන වලය. ඒ අනුව ළමයා සිය කටයුතු තමා විසින්ම සිදු කරගෙන සමාජය පිළිබඳ අවබෝධයක් ලබාගෙන වැඩිහිටියෙකු ලෙස සමාජ ගත වන තුරුම ඔහු හෝ ඇය ආරක්ෂා කරලීම දෙමාපියන්ගේ වගකීම හා යුතුකම වේ.

**7.පවුලේ ව්‍යුහය හා කාර්යභාරයන්ගේ වෙනස්වීම**

පවුලේ ව්‍යුහය හා කාර්යභාරයන්ගේ වෙනස්වීම ළමා අපයෝජනයන්ගේ වර්ධනයට හේතු වේ යැයි නිගමනය කල හැකිය. විස්තෘත පවුල තුල ළමයින්ට මහත් රැකවරණයක් සැපයිනි. පිරිමි දරුවකු පියා හෝ වැඩිහිටි පුරුෂයකු යටතේ තම කාර්ය භාර්යය හා භූමිකාව ආරෝපණය කර ගනිමින් සමාජ ගත වීමද ගැහැණු දරුවකු මව හෝ වැඩිහිටි කාන්තාවන් යටතේ තම කාර්ය භාර්යය හා භූමිකාව ආරෝපණය කර ගනිමින් සමාජ ගත වේ.එමෙන්ම දරුවන්ගේ සමාජානුයෝජන කාර්යය තුල මව පියා හැරුණු විට විස්තෘත පවුල තුල වැඩිහිටි පාර්ශවයන් මගින් දායකත්වයක් සැපයීය. වර්තමානයේ මව පියා දෙදෙනාම ආර්ථික කටයුතුවල නිරත වීම හේතුවෙන් දරුවන් රැකබලා ගැනීම බාහිර ආයතනයන්ට (දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැනි) බාරකර ඇත. එසේ නැතහොත් නිවාස තුල ම මෙහෙකරුවකු එම කාර්ය සිදු කරයි. ඒ තුල දරුවා සමාජයට නිරාවරණය වන්නේ ක්‍රමානුකූලව නොව මේ සඳහා පවුලේ ව්‍යුහයේ වෙනස් වීම සෘජුවම බලපා ඇති අතර එනම් විස්තෘත පවුල න්‍යෂ්ටික පවුලක් බවට පරිවර්තනය වීම මෙහිලා හඳුනාගත හැකිය.පැරණි පවුල තුල පවුලේ ආර්ථික කෘත්‍යයේ වැඩි වගකීම පියාට පැවරුණු අතර දරුවන් හදා වඩා ගැනීම මවට පැවරුණකි. එම කාර්යය විභජනය මනා පෞරුෂ්‍යකින් යුතු දරුවකු සමාජගත වීමට බලපෑ නමුත් අද වන විට දෙමව්පිය දෙදෙනාගේ ම රැකියා නියුක්තිය දරුවන්ගේ සමාජානුයෝජනයට මෙන්ම සුරක්ෂිතභාවයට ද තර්ජනයක් වී ඇතිබව පැහැදිලි කරුණකි.

**8. සමාජය තුල ආනෝමීයත්වය බිඳ වැටීම**

සමාජය විසංවිධානකාරී වීම සඳහා අනෝමීයත්වය බිඳ වැටීම බලපාන බව එමිල් ඩුර්කයිම් සඳහන් කරන ලදි. එනම් සමාජ සබඳතා ජාලයේ බිඳ වැටීම මේ සඳහා හේතු වේ. සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාවයේ සිට ඓන්ද්‍රිය ඒකාබද්ධතාවය දක්වා වෙනස් වීම හේතුවෙන් සමාජය තුල විපරීත තත්ත්වයක් පැන නගිනු ඇතැයි ඔහු සඳහන් කරයි. මේ තත්ත්වය ළමා අපයෝජනයන්ගේ ප්‍රමාණය ඉහළ යාමට හේතු වී ඇත. 1977 න් පසු විවෘත ආර්ථිකය ලංකාවට හඳුන්වා දීමත් සමඟ ළමා අපයෝජනයන්ගේ හා අපචාරයන්ගේ වර්ධනයක් හා එය සිදුවන හා සිදුකරන ස්වභාවයේ වෙනස්වීමක් හඳුනා ගැනීමට සාධක සමාජය තුලින් සොයා ගත හැකිය.එමෙන්ම සමාජ සාරධර්ම බිඳ වැටීම හා දෙමව්පිය දූ දරුවන් අතර පවත්නා විකෘති සම්බන්ධතා සමාජය විසංවිධානකාරී වීම සඳහා බලපායි.

**9. සමාජය තුල විවෘතව කථා නොකරන ලිංගික අධ්‍යාපනය හා ඒ තුල ජනිත වන කුතුහලය**

*ISBN 978-955-4563-72-8*

බොහෝ පාසල් දරුවන් අපචාර වලට පෙළඹෙන්නේ ඔවුන් තුල පවත්නා කුතුහලය නිසාවෙනි. ඔවුන් අපයෝජනයට ලක්වන්නේ ඔවුන් තුල පවතින නොදැනුවත් බාවය නිසාවෙනි. මේ දෙකටම සුදුසු විසඳුම වන්නේ ලිංගික අධ්‍යාපනය පිළිබඳව ළමුන්ට ක්‍රමානුකූල අධ්‍යාපනයක් ලබා දීමයි. නව යොවුන් වියේ දරුවන් තමන්ගේ ශාරීරික වෙනස්වීම් පිළිබඳ උනන්දු වීම සාමාන්‍ය දෙයකි. ඒ පිළිබඳ අධ්‍යාපනය ලබා දීමට පැරණි සමාජය තුල විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරන ලදි. එදා වැඩිවියට පත් වූ දියණිය වැඩිහිටි කාන්තාවක් බාරයේ රඳවා ඒ කාලය තුල ඇයට ලිංගික අධ්‍යාපනය හා පවුලක වගකීම් පිළිබඳව ඇගේ ශාරීරික වෙනස්කම් පිළිබඳව නිසි අවබෝධයක් ලබාදීම තුල ඇය සමාජය තුල සුරක්ෂිත විය යුතු ආකාරය පිළිබඳව අවබෝධයක් ලබාගත්තාය.එමෙන්ම කන්‍යාභාවය පිළිබඳව තිබූ සමාජ මතය ද ඇය සුරක්ෂිත කරලීමට යම් පෙළඹවීමක් කල බව සැබෑවකි. අද වනවිට එය සමාජය තුල හණමිටි අදහස් ලෙස අවශේෂ සාධකයක් වීම ම ඇගේ වටිනාකම ඇය විසින්ම අවතක්සේරු කර ගැනීමට හේතු වී ඇති බවට සාක්ෂි ගොනුකල හැකිය.

## 10. මානසික ව්‍යාධීන් සහිත පිරිස් සමාජය තුල වැඩිවීම

උක්ත සඳහන් කල පරිදි සමාජය තුල අනෝමියත්වය බිඳ වැටීම හේතුවෙන් මිනිසා මානසික ආබාධයන්ට ගොදුරුවීම සුලභව හඳුනාගත හැකිය. පවතින සංකීර්ණ සමාජය හා තාක්‍ෂණික සංකීර්ණත්වය ඒ තුලින් දූෂණය වන මනස තුල නිර්මාණය වන අසමබර පෞරුෂයද මානසික ව්‍යාකුලතා සහිත රෝගීන් සමාජගත වන්නට හේතුවේ. ඔවුන් බොහෝ විට විපරීත කාමුක ආශාවන්ගෙන් පෙලෙන අතර ළමයින් පහසුවෙන් ඔවුන්ගේ ගොදුරු බවට පත්වේ. බොහෝ විට දරුවන් අපයෝජනයට ලක් කරන අපයෝජකයන් බිහි වන්නේ මත් ද්‍රව්‍ය භාවිතය, අවිවාහක බව, අවිවේකී බව නිසා ඇතිවන මානසික හුදකලා බව, ලිංගික පීඩනය, යහපත් ළමා කාලයක් නොතිබීම වැනි සාධක වල ඍජු හෝ වක්‍ර බලපෑම් හේතුවෙනි. හඳුනාගනු ලැබූ ළමා අපයෝජනයකන්ට හා අපචාර සඳහා ස්ථිර සාර විසඳුමක් අවශ්‍ය වේ. ඒ සඳහා

- බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති සැකසිය යුතුය. මෙහිදී ළමා අපචාර සම්බන්ධව පාර්ලිමේන්තුව වැනි නීති සම්පාදන ආයතන විසින් තීරණ ගත යුතු අතර එහිදී ළමා අපයෝජනය සම්බන්ධ නීති ක්‍රියාත්මක කළ යුතුය.
- එමෙන්ම ළමයින් පිළිබඳව සංවේදී හැඟීම්, සමාජ කතිකාවකට භාජනය කිරීම හා එය බිම් මට්ටමෙන් ඇරඹීම තුළළමා පරපුර මෙන්ම වැඩිහිටි පරපුර ද දැනුවත් කිරීම අතිශය වැදගත්ය.
- අපයෝජනයට ලක් වූ දරුවකු සමාජ ගත කිරීමේදී දරුවා පිළිබඳ සමාජය තුළ සුභවාදී ආකල්පයක් ඇති කරන්නට සමත් වීම තුළළමයා මානසික පීඩනයෙන් වලක්වා ගත හැක.
- දරුවා තුල තමා පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමටත් අපයෝජනයට ලක් වීමට ඇති අවස්ථා හඳුන්වා දීමත් සිදුවිය යුතුය. එහි වගකීම පවුලේ සාමාජිකයින්ට හා පාසලට හිමිවේ. මෙම ආයතන දෙක විසින් මෙම පැහැදිලි කිරීම සිදු කළ යුතුය.
- එසේම පවුලේ වැඩිහිටියන්ගේ රැකවරණය සහ ආදරය ළමුන් වෙනුවෙන් ලබාදීම පවුල ළමයා වෙනුවෙන් වග වන ආයතනයක් බවට පත් වීම තුල වැරදි ක්‍රියා වලට යොමුවීම වලක්වාලයි.
- ළමා අපචාර වලට ළමා මනස පොළඹවන මාධ්‍යය භාවිතයන්ගෙන් ඔවුන්ගෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු අතර එහිදී අන්තර්ජාල භාවිතය, සමාජ වෙබ් අඩවි භාවිතය වැනි කාරණා වලදී සැලකිලිමත් විය යුතුය. මන්ද බොහෝ විට මෙම වෙබ් අඩවි හරහා හුවමාරු වන්නේ ළමා මනසට නුසුදුසු රූප රාමු සහ අදහස්ය.
- අසභ්‍ය චිත්‍ර පට අලෙවි සැල් වැටලීම නිරන්තරයෙන් සිදු කිරීම හා ඊට අදාල පුද්ගලයින් නීතියේ රැහැනට නතු කර ගැනීම තුල බොහෝ ගැටළු අවම කරගත හැකිය.
- තවද ළමයින්ට එරෙහිව කරන අපරාධ සඳහා ක්‍රියාත්මක වන නීති පිළිබඳව සමාජය දැනුවත් වීම තුල අපරාධ වලට යොමු වන ප්‍රතිශතය අවම කර ගත හැකිය. එහිදී ප්‍රධාන වශයෙන් මෙම නීතිය කොටස් 05 ක් හඳුනා ගත හැකිය.

❖ ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන වැරදි වලට අදාල නීති

*ISBN 978-955-4563-72-8*

- ළමයින් සේවයේ යෙදවීමට අදාල නීති
- බාල අපරාධකරුවන් පිළිබඳව යුක්තිය පසිඳලීමට අදාල නීති
- භාරකාරත්වය නඩත්තුව රැකවරණය උප්පැනයන් ලියාපදිංචි පුරවැසිභාවය වැනි පවුල් නීතිය පිළිබඳ ක්ෂේත්‍රයට ඇතුලත් වන නීති
- සිවිල් හා අපරාධ උසාවි කාර්ය පටිපාටියට අදාල නීති

(ළමා අංශය, මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය)

මෙම නීති බලාත්මක කරලීම තුල සමාජයේ ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය යම් තරමකට අවම කරලීමට හැකිය. ගෝලීය වශයෙන් ආර්ථික සමාජ වටපිටාව හසුරුවන තුන්වන ලෝකයේ රටවල් විසින් රටක අනාගතයේ කොඳු නාරටිය වන ළමා පරපුර රැක ගැනීමට පුළුල් ලෙස ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා පහත පරිදි ළමයින්ට අදාලව නීති සම්පාදනය වී ඇත. ශ්‍රී ලංකාවේ ළමයින්ට අදාලව පහත ආඥාපනත් වල නීති සඳහන්ය.

- 1995 අංක 22 දරන පනතින් සහ 1998 අංක 29 දරන පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහය
- 1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥා පනත සහ එහි සංශෝධන
- 1841 පාදඩ ආඥා පනත සහ එහි සංශෝධන
- 1956 අංක 04 දරන ළමා හා යෞවන (හානිකර ප්‍රකාශන) පනත
- 1927 අංක 04 දරන අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත
- 1995 අංක 20, අංක 19 සහ 1998 අංක 28 දරන පනත් වලින් සංශෝධිත අපරාධ නඩු විධාන සංග්‍රහ පනත
- 1979 අංක 38 සහ 1992 අංක 15 දරන පනත් වලින් සංශෝධිත ළමයින් කුළ වැද්දීමේ ආඥා පනත
- 1964 අංක 43, 1973 අංක 29 සහ 1984 අංක 32 දරන පනත් වලින් සංශෝධිත 1956 අංක 47 දරන කාන්තාවන්, යෞවනියන් හා ළමයින් සේවයෙහි යෙදීමේ පනත සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසි
- 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස ගත කිරීම පිළිබඳ ආඥා පනත සහ එහි සංශෝධන
- 1944 අංක 22 දරන අනාථ නිවාස ආඥා පනත
- 1939 අංක 28 දරන තරුණ වරද කරුවන් (පුහුණු පාසල්) පිළිබඳ ආඥා පනත
- 1951 අංක 17 දරන උප්පැන්න මරණ ලියාපදංචි කිරීමේ පනත
- 1980 අංක 53, 1977 අංක 20 හා 1977 අංක 19 දරන පනත් මගින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහය
- 1955 අංක 18 හා 1997 අංක 12 දරන පනත් වලින් සංශෝධිත 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥා පනත සහ 1995 දරන 19 පනතින් සංශෝධිත 1952 අංක 44 දරන උඩරට විවාහ හා දික්කසාද පනත
- 1972 අංක 19 1978 අංක 2 හා 1999 අංක 32 දරන පනත් වලින් සංශෝධිත 1889 අංක 19 දරන නඩත්තු ආඥා පනත
- 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත් සහ ඒ යටතේ පනවා ඇති අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි
- 1848 අංක 20 දරන ආගමන හා විගමන පනත හා එහි සංශෝධන
- 1979 අංක 4 දරන බීමත්කම යටතේ සිදු කරන වැරදි පිළිබඳ වැරදි
- 1998 අංක 27 හා 1979 අංක 37 දරන පනත් වලින් සංශෝධිත 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත
- 1989 අංක 17 දරන පනතින් සංශෝධිත 1965 අංක 7 දරන වයස පූර්නත්ව ආඥා පනත

(ළමා අංශය, මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය, පි. 1,2)

ISBN 978-955-4563-72-8

ඉහත සඳහන් අන පනත් බලාත්මක කිරීම මගින් ළමා අයිතිවාසිකම් තහවුරු කරමින් ළමුන් අපයෝජනයට හා අපචාර වලට පෙළඹවීමේ අවස්ථාවන් වලක්වා ඇත.එසේම ළමයා යනු අවධානම් කාල පරිච්ඡේදයකි. ඔහුට සමාජ අත්දැකීම් අත්විදීම් අවමය. ඒ තුළ අනතුරු ආපදා සහ අපයෝජනයන්ට ගොදුරු වීමේ අවධානම වැඩිය. ඔවුන් කුමන සාධකයක් මත අපචාර වලට පෙළඹුන ද සමාජ සාධක හේතු කොට ගෙන අපයෝජනයට ලක් වුව ද අවසාන වශයෙන් සමාජ ගත වන්නේ බිඳුනු පෞරුෂයකින් යුක්ත දරුවෙකි. ඔහු නිසි වයසට පත් වූ පසු ක්‍රියා කරන්නේ කුඩා කළ ලත් අත්දැකීම් අනුසාරයෙනි. එවන් දරුවෙකුගෙන් යහපත් සමාජ චර්යාවක් අපේක්ෂා කළ නොහැකිය. ඒ හේතුවෙන් ලංකාව තුළළමා අපයෝජනය හා අපචාර සම්බන්ධව මීට වඩා අවධානය යොමු කළ යුතු අතර ඒ තුල අනාගත පරපුර මුහුණ දෙන අවාසනාවන්ත තත්ත්වය වැලකිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අමරසේකර, දයා (2005) ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න හා වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ
2. කුමාර, ලාල් (2001) ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන PEACE ප්‍රකාශනයකි.
3. කුරේ, නිරංජන් (2005) ශ්‍රී ලංකාවේ සිදු වන අපයෝජන, කොළඹ 08, විදුර ප්‍රකාශන
4. කුරේ, නිරංජන්(2006) ශ්‍රී ලංකාවේ සිදු වනළමා අපයෝජන ,කොළඹ 08, විදුර ප්‍රකාශන
5. කෝණාර, දයානන්ද (සංස්) (2000)ළමා අයිතීන් උල්ලංඝනය වීම, සිතුවම ප්‍රකාශනය
6. ගුණසේකර, උපාලි (2001)ළඳුන් සහ ළමුන්, කතෘ ප්‍රකාශන
7. ජසින්තා ඇන්ටමාරි (2006)ළමා වර්ධන පරිකල්පනය හා නිර්මාණශීලීත්වය, කොළඹ 08, පහන් ප්‍රකාශකයෝ
8. නිශ්ශංක, චන්දිමා (2004) ජනමාධ්‍ය ප්‍රචන්ඩත්වය සහ ළමා අයිතිවාසිකම්, කොළඹ 10 ,ගොඩගේ සහ සහෝදරයෝ
9. රත්නපාල නන්දසේන (2007) අපරාධ විද්‍යාවේ මූලධර්ම, වරකාපොළ ආරිය ප්‍රකාශකයෝ
10. රසකැන් බෙන් (1995) බාලඅපචාරය, කොළඹ 10 ඇස් ගොඩගේ සහ සහෝදරයෝ
11. Adler, Freda, Mueller O.W. Gerhard Lauter S Williaum (2013) riminiology Fourth Edition
12. Siegelo, I Larry eight edition criminology Lowell University of Mass Chusetts
13. ලෝකයේ වෙසෙන දරුවාගේ තත්වය (2013) යුනිසෙෆ්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
14. ළමා අපයෝජනය සහ නීතිය, ළමා අංශය, මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදි සංවිධානය